ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

**සන්නිවේදන දෙපාර්තමේන්තුව**
30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
දුරකථන අංක: 2477424, 2477423, 2477311
ෆැක්ස්: 2346257, 2477739
ඊ-මේල්: dcommunications@cbsl.lk, communications@cbsl.lk
වෙබ් අඩවිය: www.cbsl.gov.lk

# පුවත්පත් නිවේදනය

| | |
|---|---|
| නිකුත් කළේ | **ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව** |
| දිනය | **2017 ඔක්තෝබර් මස 17 වැනි දින** |

## 2017 අගෝස්තු මාසයේ දී විදේශීය අංශයේ ක්‍රියාකාරිත්වය

**සමස්ත නිරීක්ෂණ**

2017 වසරේ අගෝස්තු මාසයේ දී ශ්‍රී ලංකාවේ විදේශීය අංශය මිශ්‍ර ක්‍රියාකාරිත්වයක් පෙන්නුම් කළේය. අපනයන ආදායම වර්ධනය වුවද, ආනයන වියදම වැඩි වේගයකින් ඉහළ යෑම හේතුවෙන් 2017 අගෝස්තු මාසයේ දී වෙළඳ හිඟය පුළුල් විය. 2017 අගෝස්තු මාසයේ දී සංචාරක ඉපැයීම් ඉහළ ගියද, පුළුල් වූ වෙළඳ හිඟය සමඟ විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණද අඩුවීම හේතුවෙන් විදේශීය ජංගම ගිණුමේ ක්‍රියාකාරිත්වය දුර්වල විය. කෙසේ වෙතත්, විදේශ විනිමය කාලීන මූල්‍ය පහසුකමට (Foreign Currency Term Financing Facility) අදාළ දෙවන වාරිකය රජය වෙත ලැබීම මෙන්ම කොළඹ කොටස් හුවමාරුව සහ රජයේ සුරැකුම්පත් වෙළඳපොළ වෙත වූ අඛණ්ඩ විදේශ විනිමය ලැබීම් හේතුවෙන් ගෙවුම් තුලනයෙහි මූල්‍ය ගිණුම සවිමත් විය.

**අපනයන ක්‍රියාකාරිත්වය**

ජී.එස්.පී. ප්ලස් (GSP+) සහනය නැවත ලබා ගැනීමේ යහපත් බලපෑම පෙන්නුම් කරමින් 2017 අගෝස්තු මාසයේ දී අපනයන ආදායම අඛණ්ඩව දෙවන වරටත් එ.ජ. ඩොලර් බිලියනය ඉක්මවා වර්ධනය විය. මේ අනුව, ප්‍රධාන වශයෙන් කාර්මික අපනයන ද, ඉන් අනතුරුව කෘෂිකාර්මික අපනයන ද ඉහළ යෑම හේතුවෙන් 2017 අගෝස්තු මාසයේ දී අපනයන ආදායම පෙර වසරේ අනුරූප කාල පරිච්ඡේදයට සාපේක්ෂව එ.ජ. ඩොලර් මිලියන 1,001 ක් දක්වා සියයට 15.5 කින් ඉහළ ගියේය.

2017 අගෝස්තු මාසයේ දී රෙදිපිළි හා ඇඟලුම් අපනයන ඉහළ යෑම හේතුවෙන් කාර්මික අපනයන ආදායම පෙර වසරේ අනුරූප කාල පරිච්ඡේදයට සාපේක්ෂව එ.ජ. ඩොලර් මිලියන 740 ක් දක්වා සියයට 13.1 කින් වර්ධනය විය. යුරෝපා වෙළඳපොළ වෙත සිදු කරන ලද ඇඟලුම් අපනයන ඉහළ යෑම හේතුවෙන් 2017 අගෝස්තු මාසයේ රෙදිපිළි හා ඇඟලුම් අපනයන ආදායම එ.ජ. ඩොලර් මිලියන 433 ක් දක්වා සියයට 10.1 කින් ඉහළ ගියේය. මේ අනුව, 2017 අගෝස්තු මාසයේ දී යුරෝපා සංගමය වෙත අපනයනය කරන ලද ඇඟලුම්වලින් ලද ආදායම පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව එ.ජ. ඩොලර් මිලියන 186 ක් දක්වා සියයට 12.2 කින් ඉහළ ගිය අතර, ඇඟලුම් අපනයන ආදායමේ වර්ධනය සඳහා එය සියයට 68 කට වඩා ඉහළ දායකත්වයක් දැක්විය. මේ අතර, මෙම මාසය තුළ ඇමෙරිකා එක්සත් ජනපදය සහ සාම්ප්‍රදායික නොවන වෙළඳපොළ වෙත සිදු කරන ලද ඇඟලුම් අපනයනවලින් ලද ආදායම පෙර වසරේ අනුරූප කාල පරිච්ඡේදයට සාපේක්ෂව, පිළිවෙළින්, සියයට 4.4 කින් සහ සියයට 4.6 කින් වර්ධනය විය. තවද, නැව් හා ගුවන් යානා සඳහා භාවිත කරන ඉන්ධනවල අපනයන පරිමා සහ අපනයන මිල ගණන් ඉහළ යෑම හේතුවෙන් 2017 අගෝස්තු මාසයේ දී ඛනිජ තෙල් නිෂ්පාදිත අපනයන ආදායම පෙර වසරේ අනුරූප කාල පරිච්ඡේදයට සාපේක්ෂව සියයට 74.2 කින් කැපී පෙනෙන ලෙස ඉහළ ගියේය. මීට අමතරව, එළවළු, පළතුරු සහ ඇට වර්ග ආශ්‍රිත සැකසුම් අපනයන ඉහළ යෑම හේතුවෙන් පෙර වසරේ අනුරූප කාල පරිච්ඡේදයට සාපේක්ෂව ආහාර, පාන වර්ග හා දුම්කොළ අපනයන ආදායම එ.ජ. ඩොලර් මිලියන 35 ක් දක්වා සියයට 35.8 කින් කැපී පෙනෙන ලෙස ඉහළ ගියේය. මේ අතර, පෙර වසරේ අනුරූප මාසයට සාපේක්ෂව මැණික්, දියමන්ති හා ස්වර්ණාභරණ අපනයන ආදායම සියයට 23.6 කින් ද, යන්ත්‍ර සූත්‍ර හා යාන්ත්‍රික උපකරණ අපනයන ආදායම සියයට 14.0 කින් ද රබර් නිෂ්පාදිත අපනයන ආදායම සියයට 4.1 කින් ද ඉහළ ගියේය. කෙසේ වුවද, 2017 අගෝස්තු මාසයේ දී මූල ලෝහ හා උපාංග, මුද්‍රණ කර්මාන්තය ආශ්‍රිත නිෂ්පාදිත සහ ප්‍රවාහන උපකරණ අපනයන ආදායම පහළ ගියේය.

සමස්තයක් ලෙස, සියලුම උප කාණ්ඩවල සිදු වූ වර්ධනය පිළිබිඹු කරමින් 2017 වසරේ අගෝස්තු මාසයේ දී කෘෂිකාර්මික අපනයන ආදායම පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව එ.ජ. ඩොලර් මිලියන 255 ක් දක්වා සියයට 22.8 කින් සැලකිය යුතු ලෙස වර්ධනය විය. අපනයන පරිමාව අඩුවුවද, ප්‍රධාන වශයෙන් ජාත්‍යන්තර වෙළඳපොළහි මිල ගණන් ඉහළ යෑම හේතුවෙන් තේ අපනයන ආදායම පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව එ.ජ. ඩොලර් මිලියන 131 ක් දක්වා සියයට 20.6 කින් ඉහළ ගියේය. ජාත්‍යන්තර වෙළඳපොළ තුළ තේ සඳහා පවතින ඉහළ මිල ගණන් නිරූපණය කරමින් තේ කිලෝ ග්‍රෑමයක් සඳහා වූ සාමාන්‍ය අපනයන මිල 2016 අගෝස්තු මාසයේ දී වාර්තා කළ එ.ජ. ඩොලර් 4.33 ට සාපේක්ෂව 2017 අගෝස්තු මාසයේ දී එ.ජ. ඩොලර් 5.29 ක් දක්වා සියයට 22.3 කින් ඉහළ ගියේය. තේ අපනයන පරිමාව 2016 අගෝස්තු මාසයේ දී වාර්තා කළ කිලෝග්‍රෑම් මිලියන 25.1 ට සාපේක්ෂව 2017 අගෝස්තු මාසයේ දී කිලෝග්‍රෑම් මිලියන 24.8 ක් දක්වා සියයට 1.3 කින් පහළ ගියේය. මේ අතර, ප්‍රධාන වශයෙන් ගම්මිරිස්, කුරුඳු සහ කරාබු නැටි අපනයන පරිමා ඉහළ යෑම හේතුවෙන් මෙම මාසය තුළ දී කුළුබඩු අපනයන ආදායම පෙර වසරේ අනුරූප කාල පරිච්ඡේදයට සාපේක්ෂව සියයට 40.5 කින් වර්ධනය විය. යුරෝපා වෙළඳපොළ වෙත මුහුදු ආහාර අපනයනය කිරීම සඳහා පනවා තිබූ තහනම ඉවත් කිරීම සහ ජී.එස්.පී. ප්ලස් සහනය නැවත ලැබීමේ යහපත් බලපෑම පිළිබිඹු කරමින් 2017 අගෝස්තු මාසයේ දී මුහුදු ආහාර අපනයන ආදායම පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව එ.ජ. ඩොලර් මිලියන 18 ක් දක්වා සියයට 38.6 කින් සැලකිය යුතු ලෙස වර්ධනය වූ අතර, යුරෝපා වෙළෙඳපොළ වෙත සිදු කරනු ලැබූ අපනයනවලින් ලද ආදායම සියයට 81.9 කින් වර්ධනය විය.

සමුච්චිත වශයෙන් සැලකූ විට තේ, ඛනිජ තෙල් නිෂ්පාදිත, ප්‍රවාහන උපකරණ, කුළුබඩු සහ මුහුදු ආහාර අපනයනය කිරීමෙන් ලද ආදායම් ඉහළ යෑම හේතුවෙන් 2017 වසරේ පළමු මාස අට තුළ දී අපනයන ආදායම පෙර වසරේ අනුරූප කාල පරිච්ඡේදයට සාපේක්ෂව එ.ජ. ඩොලර් මිලියන 7,413 ක් දක්වා සියයට 7.6 කින් වර්ධනය විය. කෙසේ වුවද, සමුච්චිත වශයෙන් සැලකූ විට, සලකා බලනු ලබන කාලපරිච්ඡේදය තුළ රෙදිපිළි හා ඇඟලුම්, මැණික්, දියමන්ති හා ස්වර්ණාභරණ සහ සම් භාණ්ඩ, සංචාරක භාණ්ඩ හා පාවහන් අපනයන ආදායම පහළ ගියේය.

2017 වසරේ පළමු මාස අට තුළ දී ශ්‍රී ලංකාවේ භාණ්ඩ අපනයන සඳහා වූ ප්‍රධාන වෙළඳපොළ ලෙස ඇමෙරිකා එක්සත් ජනපදය, එක්සත් රාජධානිය, ඉන්දියාව, ජර්මනිය සහ ඉතාලිය පැවති අතර එම රටවල් වෙත සිදු කරන ලද අපනයන, මුළු අපනයන ආදායමෙන් සියයට 50 ක් පමණ විය.

## සංඛ්‍යා සටහන 1: අපනයන ආදායම (අ)

| කාණ්ඩය | 2016 අගෝස්තු (එ.ජ.ඩො. මිලියන) (ආ) | 2017 අගෝස්තු (එ.ජ.ඩො. මිලියන) | වෙනස (%) | 2016 ජන-අගෝ (එ.ජ.ඩො. මිලියන) (ආ) | 2016 ජන-අගෝ (එ.ජ.ඩො. මිලියන) | වෙනස (%) |
|---|---|---|---|---|---|---|
| **1. කාර්මික අපනයන** | **654.3** | **740.1** | **13.1** | **5,337.6** | **5,562.3** | **4.2** |
| රෙදිපිළි හා ඇඟලුම් | 393.4 | 433.2 | 10.1 | 3,333.7 | 3,283.4 | (1.5) |
| එයින්, ඇඟලුම් | 372.8 | 402.3 | 7.9 | 3,155.1 | 3,088.1 | (2.1) |
| රබර් නිෂ්පාදිත | 68.2 | 71.0 | 4.1 | 508.4 | 538.1 | 5.8 |
| ආහාර, පාන වර්ග සහ දුම්කොළ | 25.6 | 34.8 | 35.8 | 222.4 | 259.1 | 16.5 |
| ඛනිජතෙල් නිෂ්පාදිත | 23.0 | 40.1 | 74.2 | 185.4 | 252.7 | 36.3 |
| යන්ත්‍රසූත්‍ර හා යාන්ත්‍රික උපකරණ | 28.6 | 32.7 | 14.0 | 200.2 | 242.1 | 20.9 |
| මැණික්, දියමන්ති හා ස්වර්ණාභරණ | 20.7 | 25.6 | 23.6 | 187.3 | 166.7 | (11.0) |
| ප්‍රවාහන උපකරණ | 7.4 | 6.4 | (13.4) | 80.9 | 138.1 | 70.7 |
| මූල ලෝහ සහ ඒ ආශ්‍රිත නිෂ්පාදිත | 12.9 | 11.4 | (11.7) | 55.8 | 72.3 | 29.6 |
| ප්ලාස්ටික් හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත | 6.4 | 5.8 | (8.3) | 46.0 | 47.2 | 2.6 |
| මුද්‍රණ කර්මාන්තය ආශ්‍රිත නිෂ්පාදිත | 5.2 | 4.0 | (22.6) | 17.7 | 28.0 | 58.3 |
| වෙනත් | 62.9 | 75.1 | 19.5 | 499.8 | 534.5 | 6.9 |
| **2. කෘෂිකාර්මික අපනයන** | **208.0** | **255.4** | **22.8** | **1,520.6** | **1,815.0** | **19.4** |
| තේ | 108.9 | 131.3 | 20.6 | 835.0 | 1,002.7 | 20.1 |
| කුළුබඩු | 35.7 | 50.2 | 40.5 | 194.1 | 248.7 | 28.1 |
| පොල් | 32.3 | 33.8 | 4.5 | 238.3 | 240.1 | 0.7 |
| මුහුදු ආහාර | 13.0 | 18.0 | 38.6 | 110.7 | 155.4 | 40.4 |
| සුළු කෘෂිකාර්මික නිෂ්පාදිත | 11.7 | 13.4 | 14.9 | 83.4 | 96.6 | 15.7 |
| රබර් | 2.3 | 2.6 | 15.3 | 20.9 | 28.7 | 37.4 |
| සකස් නොකළ දුම්කොළ | 2.2 | 3.5 | 58.1 | 19.9 | 23.5 | 18.0 |
| එළවළු | 1.9 | 2.5 | 30.8 | 18.3 | 19.5 | 6.6 |
| **3. ඛනිජ හා වෙනත් අපනයන** | **4.0** | **5.2** | **28.9** | **29.9** | **35.8** | **19.6** |
| **මුළු අපනයන** | **866.3** | **1,000.6** | **15.5** | **6,888.1** | **7,413.1** | **7.6** |

මූලයන්: ශ්‍රී ලංකා රේගුව
ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරිය
ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව හා අනෙකුත් ඛනිජ තෙල් අපනයනකරුවන්
ශ්‍රී ලංකා මහ බැංකුව

(අ) තාවකාලික
(ආ) සංශෝධිත

**ආනයන ක්‍රියාකාරිත්වය**

විශේෂයෙන්ම ඉන්ධන ඇතුළු අන්තර් භාණ්ඩ ආනයන වියදම ඉහළ යෑම හේතුවෙන් 2017 අගෝස්තු මාසයේ දී ආනයන වියදම පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව එ.ජ.ඩොලර් මිලියන 1,857 ක් දක්වා සියයට 12.6 කින් ඉහළ ගිය අතර, එය මෙම වසර තුළ මේ දක්වා වාර්තා වූ දෙවන ඉහළම ආනයන වියදම විය.

2017 අගෝස්තු මාසයේ දී අන්තර් භාණ්ඩ ආනයන වියදම පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව එ.ජ.ඩොලර් මිලියන 1,021 ක් දක්වා සියයට 23.9 කින් සැලකිය යුතු ලෙස ඉහළ ගිය අතර, ඉන්ධන ආනයන වියදම පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව එ.ජ. ඩොලර් මිලියන 312 ක් දක්වා සියයට 73.0 කින් ඉහළ යෑම මේ සඳහා ප්‍රධාන වශයෙන් හේතු විය. පිරිපහදු කරන ලද ඛනිජ තෙල් ආනයන වියදම එ.ජ.ඩොලර් මිලියන 233 ක් දක්වා සියයට 110.9 කින් සැලකිය යුතු ලෙස ඉහළ යෑම ඉන්ධන ආනයන වියදම ඉහළ යෑම සඳහා ප්‍රධාන වශයෙන්ම දායක විය. මීට අමතරව, බොරතෙල් ආනයන පරිමාව පහළ ගිය ද, ජාත්‍යන්තර වෙළඳපොළෙහි බොරතෙල් මිල ගණන් ඉහළ යෑම පිළිබිඹු කරමින් බොරතෙල් ආනයන වියදම සියයට 12.2 කින් ඉහළ ගියේය. මේ අනුව, බොරතෙල් බැරලයක් සඳහා වූ සාමාන්‍ය ආනයන මිල 2016 අගෝස්තු මාසයේ දී වාර්තා වූ එ.ජ.ඩොලර් 46.71 ට සාපේක්ෂව 2017 අගෝස්තු මාසයේ දී එ.ජ.ඩොලර් 53.07 ක් දක්වා ඉහළ ගියේය. තවද, රත්‍රන් ආනයන පරිමාව ඉහළ යෑම හේතුවෙන් රත්‍රන් ආනයන වියදම පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව එ.ජ. ඩොලර් මිලියන 65 ක් දක්වා සියයට 50.0 කින් ඉහළ ගිය අතර මූල ලෝහ ආනයන වියදම පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව සියයට 52.6 කින් ඉහළ ගියේය. 2017 අගෝස්තු මාසයේ දී රෙදිපිළි හා රෙදිපිළි උපාංග ආනයන වියදම පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව සියයට 7.9 කින් ඉහළ ගිය ඒ සඳහා රෙදිපිළි (fabrics) ආනයනය ඉහළ යෑම හේතු විය. මේ අතර, රසායනික නිෂ්පාදිත, තිරිඟු හා ඉරිඟු සහ ආහාර සැකසුම් ආනයන ඉහළ යෑම මෙම මාසය තුළ අන්තර් භාණ්ඩ ආනයනය ඉහළ යෑම සඳහා විශාල වශයෙන් දායක විය. කෙසේ වුව ද, 2017 අගෝස්තු මාසය තුළ දී ඛනිජ නිෂ්පාදිත සහ පොහොර ආනයන වියදම පෙර වසරේ අනුරූප මාසයට සාපේක්ෂව, පිළිවෙළින්, සියයට 54.8 කින් සහ සියයට 30.4 කින් පහළ ගියේය.

මේ අතර, 2017 අගෝස්තු මාසය තුළ පාරිභෝගික භාණ්ඩ ආනයන වියදම බොහෝ දුරට නොවෙනස්ව එ.ජ.ඩොලර් මිලියන 394 ක අගයක පැවතිණි. කෙසේ වුව ද, ප්‍රධාන වශයෙන්ම සහල් ආනයන වියදම ඉහළ යෑම හේතුවෙන් 2017 අගෝස්තු මාසය තුළ දී ආහාර හා පාන වර්ග ආනයන වියදම පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව

සියයට 3.7 කින් වර්ධනය විය. දේශීය වෙළඳපොළ තුළ පවතින සහල් හිඟය සපුරාලීමට ගනු ලැබූ ක්‍රියාමාර්ග හේතුවෙන් පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව සහල් ආනයන වියදම ඉහළ යෑමේ ප්‍රවණතාව අඛණ්ඩව පැවතීම හේතුවෙන් 2017 අගෝස්තු මාසයේ දී සහල් ආනයන වියදම ඉහළ ගියේය. මේ අතර, මෙම මාසය තුළ එළවළු, කිරි ආශ්‍රිත නිෂ්පාදිත සහ පළතුරු ආනයන වියදම ඉහළ ගියේය. මීට අමතරව, 2017 අගෝස්තු මාසය තුළ දී ආහාරමය නොවන පාරිභෝගික භාණ්ඩ යටතේ වර්ග කර ඇති ගෘහ හා දැව භාණ්ඩ සහ විදුලි සන්දේශ උපකරණ ආනයන වියදම ඉහළ ගියේය. කෙසේ වුව ද, 2017 අගෝස්තු මාසය තුළ දී රබර් නිෂ්පාදිත, පාන වර්ග සහ කුළුබඩු ආනයන වියදම පහළ ගියේය.

යන්ත්‍රසූත්‍ර හා උපකරණ සහ ගොඩනැගිලි ද්‍රව්‍ය ආනයනය ඉහළ යෑම පිළිබිඹු කරමින් 2017 අගෝස්තු මාසය තුළ ආයෝජන භාණ්ඩ ආනයන වියදම පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව එ.ජ.ඩොලර් මිලියන 439 ක් දක්වා සියයට 2.1 කින් ඉහළ ගියේය. මුද්‍රණ කර්මාන්තය සඳහා භාවිත කරනු ලබන යන්ත්‍රෝපකරණ, විදුලි සන්දේශ මෙවලම් සහ වායුසමීකරණ යන්ත්‍ර ආනයනය ඉහළ යෑම හේතුවෙන් මෙම මාසය තුළ දී යන්ත්‍රසූත්‍ර හා උපකරණ ආනයන වියදම පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව සියයට 2.5 කින් ඉහළ ගියේය. යකඩ හා වානේ සහ ඒ ආශ්‍රිත උපාංග, සහ පිඟන් මැටි ආශ්‍රිත නිෂ්පාදිත ආනයනය ඉහළ යෑම හේතුවෙන් ගොඩනැගිලි ද්‍රව්‍ය ආනයන වියදම පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව සියයට 6.8 කින් ඉහළ ගියේය. කෙසේ වුවද, ප්‍රධාන වශයෙන්ම ත්‍රිරෝද රථ සහ වාණිජ අරමුණු සඳහා යොදාගනු ලබන කැබ් රථ ආදී වාහන ආනයනය පහළ යෑම හේතුවෙන් 2017 අගෝස්තු මාසය තුළ දී ප්‍රවාහන උපකරණ ආනයන වියදම පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව සියයට 10.0 කින් පහළ ගියේය.

මෙම ප්‍රවණතා පිළිබිඹු කරමින්, සමුච්චිත වශයෙන් සැලකූ විට, 2017 වසරේ පළමු මාස අට තුළ ආනයන වියදම පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව එ.ජ. ඩොලර් මිලියන 13,599 ක් දක්වා සියයට 9.6 කින් ඉහළ ගිය අතර, ඒ සඳහා ඉන්ධන, රත්‍රන් සහ සහල් ආනයනය ඉහළ යෑම ප්‍රධාන වශයෙන් හේතුවිය. කෙසේ වුවද, මෙම කාලපරිච්ඡේදය තුළ යන්ත්‍ර සූත්‍ර හා උපකරණ, පෞද්ගලික රථවාහන සහ පොහොර ආනයන වියදම් පහළ ගියේය.

ඉන්දියාව, චීනය, එක්සත් අරාබි එමීර් රාජ්‍යය, සිංගප්පූරුව සහ ජපානය යන රටවල් 2017 වසරේ පළමු මාස අට තුළ ශ්‍රී ලංකාවේ ප්‍රධාන ආනයන ප්‍රභව ලෙස පැවති අතර, එම රටවල් වෙතින් සිදු කරන ලද ආනයන, මුළු ආනයනවලින් සියයට 59 ක් පමණ විය.


## සංඛ්‍යා සටහන 2: ආනයන වියදම (අ)


| කාණ්ඩය | 2016 අගෝස්තු (එ.ජ.ඩො. මිලියන) | 2017 අගෝස්තු (එ.ජ.ඩො. මිලියන) | වෙනස (%) | 2016 ජන-අගෝ (එ.ජ.ඩො. මිලියන) | 2017 ජන-අගෝ (එ.ජ.ඩො. මිලියන) | වෙනස (%) |
|---|---|---|---|---|---|---|
| **1. පාරිභෝගික භාණ්ඩ** | **393.7** | **393.8** | **0.0** | **2,824.9** | **2,952.1** | **4.5** |
| ආහාර හා පානවර්ග | 142.6 | 147.9 | 3.7 | 1,039.1 | 1,204.5 | 15.9 |
| ධාන්‍ය හා ඇඹරුම් කර්මාන්තය ආශ්‍රිත නිෂ්පාදිත | 1.5 | 22.7 | 1,375.4 | 13.6 | 185.0 | 1,257.2 |
| එයින්, සහල් | 0.8 | 21.3 | 2,494.8 | 7.2 | 176.4 | 2,346.4 |
| එළවළු | 23.7 | 32.7 | 38.3 | 251.7 | 235.7 | (6.4) |
| කිරි ආශ්‍රිත නිෂ්පාදිත | 18.1 | 22.9 | 26.9 | 157.1 | 202.9 | 29.2 |
| සීනි හා රසකැවිලි | 39.7 | 19.1 | (51.8) | 195.9 | 188.8 | (3.6) |
| කුළුබඩු | 13.6 | 8.0 | (41.2) | 90.4 | 64.3 | (28.8) |
| පළතුරු | 4.4 | 6.8 | 54.7 | 45.8 | 55.0 | 20.2 |
| පාන වර්ග | 13.7 | 6.9 | (49.5) | 63.1 | 54.2 | (14.2) |
| වෙනත් ආහාර හා පාන වර්ග | 27.8 | 28.6 | 2.8 | 221.5 | 218.7 | (1.3) |
| ආහාරමය නොවන පාරිභෝගික භාණ්ඩ | 251.1 | 245.9 | (2.1) | 1,785.8 | 1,747.6 | (2.1) |
| රථවාහන | 74.1 | 72.6 | (2.0) | 547.1 | 505.0 | (7.7) |
| බෙහෙත් හා ඖෂධීය නිෂ්පාදිත | 44.5 | 44.5 | (0.0) | 354.2 | 334.9 | (5.4) |
| විදුලි සන්දේශ උපකරණ | 19.4 | 23.1 | 18.9 | 151.8 | 175.0 | 15.3 |
| ගෘහ හා දැව භාණ්ඩ | 15.3 | 20.7 | 35.4 | 115.6 | 119.3 | 3.3 |
| වෙනත් ආහාරමය නොවන පාරිභෝගික භාණ්ඩ | 97.7 | 84.9 | (13.1) | 617.1 | 613.4 | (0.6) |
| **2. අන්තර් භාණ්ඩ** | **824.0** | **1,020.8** | **23.9** | **6,309.0** | **7,271.7** | **15.3** |
| ඉන්ධන | 180.6 | 312.5 | 73.0 | 1,500.8 | 2,152.8 | 43.4 |
| එයින්,බොරතෙල් | 68.6 | 76.9 | 12.2 | 370.1 | 391.1 | 5.7 |
| පිරිපහදු කළ ඛනිජතෙල් | 110.3 | 232.7 | 110.9 | 1,030.8 | 1,587.7 | 54.0 |
| ගල්අඟුරු | 1.7 | 2.8 | 59.1 | 99.9 | 174.0 | 74.2 |
| දියමන්ති, අගනා ගල් හා ලෝහ වර්ග | 53.8 | 74.4 | 38.3 | 299.3 | 474.6 | 58.6 |
| එයින්, රත්‍රන් | 43.6 | 65.4 | 50.0 | 211.3 | 402.7 | 90.6 |
| රෙදිපිළි හා රෙදිපිළි උපාංග | 220.0 | 237.4 | 7.9 | 1,764.7 | 1,781.3 | 0.9 |
| රසායනික නිෂ්පාදිත | 66.5 | 74.9 | 12.8 | 568.1 | 549.9 | (3.2) |
| මූල ලෝහ | 34.3 | 52.3 | 52.6 | 249.5 | 353.0 | 41.5 |
| තිරිඟු හා ඉරිඟු | 23.1 | 31.3 | 35.6 | 164.5 | 225.2 | 36.9 |
| ආහාර සැකසුම් | 17.8 | 23.3 | 31.0 | 154.7 | 200.7 | 29.7 |
| කෘෂිකාර්මික යෙදවුම් | 16.6 | 20.2 | 21.6 | 116.8 | 129.6 | 10.9 |
| ඛනිජ නිෂ්පාදිත | 28.5 | 12.9 | (54.8) | 156.7 | 121.6 | (22.4) |
| පොහොර | 20.6 | 14.3 | (30.4) | 99.2 | 64.0 | (35.4) |
| වෙනත් | 162.2 | 167.4 | 3.2 | 1,234.8 | 1,219.1 | (1.3) |
| **3. ආයෝජන භාණ්ඩ** | **429.7** | **438.7** | **2.1** | **3,259.6** | **3,237.7** | **(0.7)** |
| යන්ත්‍රසූත්‍ර හා උපකරණ | 218.9 | 224.3 | 2.5 | 1,815.4 | 1,738.3 | (4.2) |
| ගොඩනැගිලි ද්‍රව්‍ය | 144.1 | 153.9 | 6.8 | 1,025.7 | 1,054.8 | 2.8 |
| ප්‍රවාහන උපකරණ | 66.3 | 59.7 | (10.0) | 414.3 | 438.6 | 5.9 |
| වෙනත් ආයෝජන භාණ්ඩ | 0.3 | 0.8 | 129.7 | 4.1 | 6.0 | 45.8 |
| **4. වර්ග නොකළ ආනයන** | **1.7** | **3.6** | **112.1** | **9.4** | **137.5** | **1,358.3** |
| **මුළු ආනයන** | **1,649.1** | **1,856.9** | **12.6** | **12,402.9** | **13,599.1** | **9.6** |

මූලයන්: ශ්‍රී ලංකා රේගුව
ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව
ලංකා අයි.ඕ.සී. සමාගම
ශ්‍රී ලංකා මහ බැංකුව

(අ) තාවකාලික

### රූප සටහන 1: අපනයන සහ ආනයන ක්‍රියාකාරිත්වය





මූලයන්: ශ්‍රී ලංකා මහ බැංකුව

ශ්‍රී ලංකා රේගුව

### වෙළඳ ශේෂය

වෙළඳ හිඟය 2016 අගෝස්තු මාසයේ පැවති එ.ජ. ඩොලර් මිලියන 783 සිට 2017 අගෝස්තු මාසයේ දී එ.ජ. ඩොලර් මිලියන 856 ක් දක්වා පුළුල් විය. මේ අතර, 2017 වසරේ පළමු මාස අට තුළ සමුච්චිත වෙළඳ හිඟය, 2016 වසරේ අනුරූප කාලපරිච්ඡේදයේ දී වාර්තා වූ එ.ජ. ඩොලර් මිලියන 5,515 හා සැසඳීමේ දී එ.ජ. ඩොලර් මිලියන 6,186 ක් දක්වා ඉහළ ගියේය.

### රූප සටහන 2: මාසික වෙළඳ ශේෂය




මූලයන්: ශ්‍රී ලංකා මහ බැංකුව

ශ්‍රී ලංකා රේගුව

**සංචාරක ඉපැයීම්**

2017 වසරේ අගෝස්තු මාසයේ දී සංචාරක පැමිණීම් පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදය හා සැසඳීමේ දී සියයට 2.5 කින් වර්ධනය වූ අතර, සංචාරක පැමිණීම් සංඛ්‍යාව 190,928 ක් විය. පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදය හා සැසඳීමේ දී, 2017 වසරේ පළමු මාස අට තුළ දී මුළු සංචාරක පැමිණීම් 1,406,854 ක් දක්වා සියයට 3.5 කින් වර්ධනය විය. ඉන්දියාව, චීනය, එක්සත් රාජධානිය, ජර්මනිය හා ප්‍රංශය යන රටවල් 2017 වසරේ පළමු මාස අට තුළ දී සංචාරකයන් පැමිණි ප්‍රධාන මූලාශ්‍ර වූ අතර, එම රටවලින් පැමිණි සංචාරකයින් සංඛ්‍යාව මෙම කාලපරිච්ඡේදයේ දී පැමිණි මුළු සංචාරකයන්ගෙන් සියයට 51.7 ක් විය. ඒ අනුව, මාසය තුළ දී සංචාරක ඉපැයීම්[1] එ.ජ. ඩොලර් මිලියන 327.6 ක් වූ අතර, වසරේ පළමු මාස අට තුළ දී සමුච්චිත සංචාරක ඉපැයීම්, පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයේ දී වූ එ.ජ. ඩොලර් මිලියන 2,333.1 සිට එ.ජ. ඩොලර් මිලියන 2,413.7 ක් දක්වා වර්ධනය විය.

**විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ**

මැද පෙරදිග කලාපයේ පවතින අහිතකර ආර්ථික හා භූ දේශපාලනික තත්ත්වය විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ මත තවදුරටත් අහිතකර බලපෑමක් ඇති කළේය. 2017 වසරේ අගෝස්තු මාසයේ දී විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ, 2016 වසරේ අගෝස්තු මාසයේ දී වාර්තා වූ එ.ජ. ඩොලර් මිලියන 618.3 හා සැසඳීමේ දී එ.ජ. ඩොලර් මිලියන 556.6 ක් දක්වා සියයට 10.0 කින් අඩු විය. තවද, 2017 වසරේ පළමු මාස අට තුළ දී විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණවල සමුච්චිත ලැබීම්ද, 2016 වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව, එ.ජ. ඩොලර් මිලියන 4,503.3 ක් දක්වා සියයට 6.3 කින් අඩු විය.

[1] සංචාරක ඉපැයීම් තාවකාලික ඇස්තමේන්තු වන අතර, 2017 වසර සඳහා ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන අධිකාරිය විසින් නිකුත් කරනු ලබන ඇස්තමේන්තුගත සාමාන්‍ය දෛනික වියදම සහ සංචාරකයෙකු මෙරට ගත කරන සාමාන්‍ය කාලසීමාව පිළිබඳව සිදු කෙරෙන සමීක්ෂණයේ වාර්තාව අනුව සංශෝධනය විය හැකිය.

**මූල්‍ය ලැබීම්**

2017 වසරේ පළමු මාස අට තුළ දී කොළඹ කොටස් වෙළඳපොළ වෙත වූ ආයෝජන එ.ජ. ඩොලර් මිලියන 328.3 ක ශුද්ධ ලැබීමක් වාර්තා කළ අතර, එය පිළිවෙළින් ද්විතීයික වෙළඳපොළ හා ප්‍රාථමික වෙළඳපොළ වෙත වූ එ.ජ. ඩොලර් මිලියන 180.7 ක හා එ.ජ. ඩොලර් මිලියන 147.6 ක ශුද්ධ ලැබීම්වලින් සමන්විත විය. රාජ්‍ය සුරැකුම්පත් වෙළඳපොළෙහි විදේශීය ආයෝජන අඛණ්ඩව ශුද්ධ ලැබීමක් වාර්තා කළ අතර, එය 2017 වසරේ අගෝස්තු මාසයේ දී එ.ජ. ඩොලර් මිලියන 86.4 ක ශුද්ධ ලැබීමක් විය. 2017 වසරේ පළමු මාස අට තුළ දී රාජ්‍ය සුරැකුම්පත් වෙළඳපොළ වෙතින් වූ සමුච්චිත විදේශීය ආයෝජන එ.ජ. ඩොලර් මිලියන 68.0 ක ශුද්ධ ලැබීමක් වාර්තා කළේය. 2017 වසරේ පළමු මාස අට තුළ දී විදේශ විනිමය කාලීන මූල්‍ය පහසුකම තුළින් ලද මුදල් ද ඇතුළත්ව රජය වෙත ලැබුණු දිගුකාලීන ණය ප්‍රමාණය, 2016 වසරේ අනුරූප කාලපරිච්ඡේදයේ දී වාර්තා වූ එ.ජ. ඩොලර් මිලියන 574.1 ක ශුද්ධ ලැබීමට සාපේක්ෂව එ.ජ. ඩොලර් මිලියන 1,031.5 ක ශුද්ධ ලැබීමක් වාර්තා කළේය.

**ගෙවුම් තුලනයේ සමස්ත තත්ත්වය**

2017 වසරේ පළමු මාස අට තුළ දී සමස්ත ගෙවුම් තුලනය, 2016 වසරේ අනුරූප කාලපරිච්ඡේදයේ දී වාර්තා කරන ලද එ.ජ. ඩොලර් මිලියන 211.5 ක අතිරික්තයට සාපේක්ෂව එ.ජ. ඩොලර් මිලියන 2,174.9 ක අතිරික්තයක් ලෙස ඇස්තමේන්තු කර ඇත.

**ජාත්‍යන්තර සංචිත සහ විනිමය අනුපාතිකයේ හැසිරීම**

2017 වසරේ අගෝස්තු මස අග වන විට ශ්‍රී ලංකාවේ දළ නිල සංචිත ප්‍රමාණය ආනයනික මාස 4.5 කට සමාන වන පරිදි එ.ජ. ඩොලර් බිලියන 7.7 ක් වූ අතර, මුළු විදේශීය වත්කම් ප්‍රමාණය ආනයනික මාස 5.7 කට සමාන වන පරිදි එ.ජ. ඩොලර් බිලියන 9.8 ක් විය.

2016 වසර අවසානයේ සිට 2017 ඔක්තෝබර් 16 දින දක්වා කාලපරිච්ඡේදය තුළ දී ශ්‍රී ලංකා රුපියල, එ.ජ. ඩොලරයට සාපේක්ෂව සියයට 2.6 කින් මධ්‍යස්ථ ලෙස අවප්‍රමාණය විය. තවද, අනෙකුත් විදේශ ව්‍යවහාර මුදල්වල හැසිරීම පිළිබිඹු කරමින් මෙම කාලපරිච්ඡේදය තුළ දී ශ්‍රී ලංකා රුපියල, යුරෝවලට සාපේක්ෂව සියයට 13.0 කින් ද, ස්ටර්ලින් පවුමට සාපේක්ෂව සියයට 9.9 කින් ද, ජපන් යෙන්වලට සාපේක්ෂව සියයට 6.2 කින් ද, කැනේඩියානු ඩොලරයට සාපේක්ෂව සියයට 9.7 කින් ද, ඕස්ට්‍රේලියානු ඩොලරයට සාපේක්ෂව සියයට 10.4 කින් ද සහ ඉන්දියානු රුපියලට සාපේක්ෂව සියයට 7.2 කින් ද අවප්‍රමාණය විය.

## සංඛ්‍යා සටහන 3: විදේශීය අංශයේ ක්‍රියාකාරිත්වයෙහි සාරාංශය (අ)

| කාණ්ඩය | 2016 අගෝස්තු (එ.ජ.ඩො. මිලියන) | 2017 අගෝස්තු (එ.ජ.ඩො. මිලියන) | වෙනස (%) | 2016 ජන-අගෝ (එ.ජ.ඩො. මිලියන) | 2017 ජන-අගෝ (එ.ජ.ඩො. මිලියන) | වෙනස (%) |
|---|---|---|---|---|---|---|
| අපනයන | 866.3 (ආ) | 1,000.6 | 15.5 | 6,888.1(ආ) | 7,413.1 | 7.6 |
| ආනයන | 1,649.1 | 1,856.9 | 12.6 | 12,402.9 | 13,599.1 | 9.6 |
| වෙළඳ ශේෂය (ශුද්ධ) | -782.8(ආ) | -856.3 | | -5,514.7(ආ) | -6,186.0 | |
| සංචාරක ඉපැයීම් | 319.6 | 327.6 | 2.5 | 2,333.1 | 2,413.7 | 3.5 |
| විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ | 618.3 | 556.6 | -10.0 | 4,804.1 | 4,503.3 | -6.3 |
| කොළඹ කොටස් වෙළඳපොළ වෙත වූ ලැබීම් (ශුද්ධ) (ඇ) | 6.7 | 75.5 | 1,022.8 | -24.1 | 328.3 | |
| රාජ්‍ය අංශයේ ලැබීම් (ඈ) එයින්, | 366.6 (ආ) | 760.2 | 107.3 | 3,673.6(ආ) | 4,393.3 | |
| භාණ්ඩාගාර බිල්පත් සහ භාණ්ඩාගාර බැඳුම්කර | 127.1 | 140.3 | 10.4 | 1,036.5 | 1,074.0 | |
| ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර | - | - | - | 1,500.0 | 1,500.0 | |
| දිගුකාලීන ණය | 239.5 (ආ) | 619.8 | 158.8 | 1,137.1(ආ) | 1,819.3 | |
| විදේශ විනිමය කාලීන මූල්‍ය පහසුකම | - | 550.0 | - | 300.0 | 1,000.0 | |
| ජා.මූ.අ. - විස්තීර්ණ ණය පහසුකම | - | - | - | 168.1 | 167.2 | |
| විදේශීය සෘජු ආයෝජන (ඉ) | - | - | - | 293.0 | 711.2 | |

මූලයන්: ශ්‍රී ලංකා රේගුව
ශ්‍රී ලංකා මහ බැංකුව
ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය
කොළඹ කොටස් වෙළඳපොළ
ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය

(අ) තාවකාලික

(ආ) සංශෝධිත

(ඇ) ප්‍රාථමික සහ ද්විතීයික වෙළඳපොළ ගනුදෙනු ඇතුළත් වේ

(ඈ) රජයට ලැබුණු ප්‍රාග්ධන සහ ජංගම සංක්‍රාම, භාණ්ඩාගාර බිල්පත් හා බැඳුම්කර මත විදේශ ආයෝජකයන් විසින් කරන ලද ආයෝජන, ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර, ඒකාබද්ධ ණය පහසුකම් සහ රජයට ලැබුණු දිගුකාලීන ණය යනාදිය රාජ්‍ය අංශයේ ලැබීම් තුළ ඇතුළත් වේ.

(ඉ) දත්ත පවතිනුයේ පළමු මාස හය සඳහා වන අතර, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය විසින් වාර්තා කළ පරිදි සෘජු ආයෝජන සමාගම් වෙත වූ විදේශීය ණය සහ කොළඹ කොටස් වෙළඳපොළ වෙත වූ ශුද්ධ සෘජු ආයෝජන ඇතුළත් වේ.